# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1708/34 - 2011 ජුනි 03 වැනි සිකුරාදා - 2011.06.03

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

17(අ) වගන්තිය යටතේ නියෝගය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 17(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින්,

(අ) මෙම වගන්තියේ දක්වා ඇති ඕනෑම සමාගමකට අදාලව එකී වගන්තියේ (2) උප වගන්තියෙහි කාර්යයන් සඳහා, මෙම නියෝගයෙහි උපලේඛන 1 කොටසේ දක්වා ඇති, ක්‍රියාවන් නිශ්චිත කොට දැක්වීම ; සහ

(ආ) මෙම උපලේඛනයේ II කොටසෙහි I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති අදාල ආයෝජන ප්‍රමාණයන්ට නොඅඩුව, එකී ඕනෑම ක්‍රියාවක ආයෝජනය කරමින්, එකී නව ව්‍යවසායක් පවත්වාගෙන යනු ලබන සහ, II කොටසේ, II තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති අදාල බදු නිදහස් කාලසීමාව ආරම්භයේ සිට වර්ෂයක් ඉක්මයාමට පෙර, එකී ආයෝජනය සම්පූර්ණ වශයෙන් සිදුකර ඇති, ඕනෑම සමාගමකට එකී නව ව්‍යවසායෙන් වූ ලාභ හා ආදායම් සම්බන්ධයෙන් උපලේඛනයේ II කොටසේ, II තීරුවෙහි දක්වා ඇති අදාල බදු නිදහස් කාලසීමාව ප්‍රදානය කිරීම,

සිදු කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 අප්‍රේල් මස 29 වැනි දින,<br>
කොළඹ,<br>
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

*I කොටස*

*ක්‍රියාකාරකම්*

1. *කෘෂිකර්මාන්තය හෝ වන වගාව ඃ*
   - ආහාර බෝග වගාව, කාර්මික බෝග වගාව හෝ උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන
   - වන වගාව

2. *සත්ත්ව පාලනය ඃ*

කිරි නිෂ්පාදනය, කුකුළන්, ඌරන්, එළුවන් යනාදී සතුන් ඇති කිරීම

3. *නිෂ්පාදන ඃ*

- සලකනු ලබන අපනයන ද ඇතුළත්ව අපනයන වෙළඳපොළ සඳහා ඃ
  සාම්ප්‍රදායික නොවන භාණ්ඩ නිෂ්පාදනය හෝ සැකසීම
- දේශීය සහ/හෝ අපනයන වෙළඳපොල සඳහා නිෂ්පාදනය කිරීම ඃ
  - බෝට්ටු
  - ඖෂධ
  - ටයර් සහ ටියුබ්
  - මෝටර් වාහන අමතර කොටස්
  - ලී බඩු
  - පිඟන් මැටි භාණ්ඩ, වීදුරු භාණ්ඩ හෝ වෙනත් ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන
  - රබර් ආශ්‍රිත නිෂ්පාදන
  - රූපලාවන්‍ය නිෂ්පාදන
  - දේශියව වවන ලද කෘෂිකාර්මික නිෂ්පාදනවලින් නිපදවන ලද ආහාරමය නිෂ්පාදන
  - ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

* සම්ප්‍රදායික නොවන භාණ්ඩ අපනයනය (සලකනු ලබන/වක්‍ර අපනයනයන් ද අදාලව) සංඛ්‍යා හයක මට්ටමේ සංයෝජිත වර්ගීකරණ සංකේත යටතේ වන එක් එක් භාණ්ඩවල අයිතමවල නිමවුම් ප්‍රමාණයෙන් (90%) සියයට අනූවකට අඩු නොවිය යුතුයි.

කෙසේ වුවද දේශීය කාර්මාන්තයට සැලකිය යුතු හානියක් සිදුවන විටක දී දේශීය අලෙවිය සඳහා ලබා දී ඇති අවසරය අහිමිකිරීමේ බලය මුදල් ඇමතිවරයා සතු වේ.

4. *සේවා ඃ*

- ශ්‍රී ලංකාවෙන් බැහැර තැනැත්තෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට සේවා සැපයීම *
- සංචාරක ව්‍යාපාරය/සංචාරක ව්‍යාපාර සම්බන්ධ ව්‍යාපෘති
- හෝටල් සේවා, තානායම් පහසුකම් හෝ ඒ හා සමාන සේවා සැපයීම
- වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම් ද ඇතුළුව යටිතල පහසුකම් ව්‍යාපෘති
- ගුදම් සංකීර්ණ හෝ ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම
- ප්‍රතිරෝදීය සම්පත් යොදා ගනිමින් විදුලි බලය උත්පාදනය
- කර්මාන්තපුර, විශේෂ ආර්ථික කලාප හෝ දැනුම් නගර ඇතිකිරීම
- නාගරික නිවාස, හෝ නගර මධ්‍යස්ථාන සංවර්ධනය
- ඕනෑම සනීපාරක්ෂක පහසුකමක් සැපයීම හෝ ජල කළමනාකරණ පද්ධති ඇති කිරීම
- ජල සේවා සංවර්ධනය
- අභ්‍යන්තර ජල මාර්ග, සංවර්ධනය සහ/හෝ සම්බන්ධිත ප්‍රවාහනය (මගීන්/බඩු)
- රෝහල් ඉදිකිරීම් හා සෞඛ්‍ය සේවා සැපයීම
- නාවික යාත්‍රා හෝ ගුවන් යානා නඩත්තු කිරීම/අලුත්වැඩියා කිරීම
- ක්‍රීඩා සේවා (උදා ඃ මෝටර් රේස්/ගොල්ෆ් පාඨමාලා)
- පරිගණක මෘදුකාංග සංවර්ධනය
- සැහැල්ලු හෝ බර ඉංජිනේරු කර්මාන්තයක නිරත ඕනෑම ව්‍යාපෘතියක්
- ගවයින් සඳහා කෘත්‍රිම ප්‍රජනනය (කිරි නිෂ්පාදනය සංවර්ධන)
- උසස් අධ්‍යාපනය/නිපුණතා සංවර්ධනය/වැඩිහිටි අධ්‍යාපනය

* ශ්‍රී ලංකාවෙන් බැහැර සේවා සඳහා එකී පිරිවැටුමෙන් (70%) සියයට හැත්තෑවක් පරිවර්ථන විදේශ මුදලින් විය යුතු වේ.

5. රටට ආර්ථික ප්‍රතිලාභ හිමිවන්නේයැයි සලකා මුදල් විෂයභාර ඇමතිතුමා අනුමත කරනු ලබන වෙනත් ඕනෑම භාණ්ඩ නිෂ්පාදන හෝ සේවා සැපයීම් ව්‍යාපෘතියක්

II කොටස

| *I තීරුව*<br>*ආයෝජන මුදල* | *II තීරුව*<br>*නිදහස් කාල සීමාව* |
|---|---|
| ඇ. එ. ජ. ඩොලර් මිලියන 3 හෝ එයට සමාන වටිනාකමට නොඅඩු | වර්ෂ 05 |
| ඇ. එ. ජ. ඩොලර් මිලියන 5 හෝ එයට සමාන වටිනාකමට නොඅඩු | වර්ෂ 06 |
| ඇ. එ. ජ. ඩොලර් මිලියන 7 හෝ එයට සමාන වටිනාකමට නොඅඩු | වර්ෂ 07 |

* 1 වැනි තීරුවේ II කොටසේ අවම ආයෝජන වටිනාකම ඉඩම්, පිරියත යන්ත්‍රෝපකරණ සහ උපකරණ වැනි ස්ථාවර වත්කම්වල වටිනාකමින් සමන්විත විය යුතු වේ.

06-395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.